# සෙනරත් පරණවිතානන සඳකඩපහණේ සංකේතාර්ථ සම්බන්ධයෙන් දැක් වූ අර්ථකතනය සම්බන්ධ අභියෝග

එස්.ඒ.එස්. සඳමාලි[1]

සඳකඩපහණ පූජනීය හෝ රාජකීය ගොඩනැගිල්ලකට ඇතුළුවන ස්ථානයේ පියගැටපෙළ පාමුල ඇති අර්ධ චන්ද්‍රාකාර ශෛලමය පාටිකාවකි. මෙහිදී සඳකඩපහණේ කැටයම් තුළින් මතුවන අර්ථය විවිධ පැතිකඩාශ්‍රිතව විහිදවන කලා ඥානය ප්‍රශස්ත තලයකට ගෙන යාමට සෙනරත් පරණවිතානයන් දැක්වූ අර්ථකතනය කුමක්ද? එයට කලා විචාරකයන්, විද්වතුන් දැක්වූ ප්‍රතිචාරය කුමක්ද? යන්න සාහිත්‍යයමය හා පුරාවිද්‍යා මූලාශ්‍රය පදනම් කරගෙන මෙහිදී අධ්‍යයනය සිදුකර ඇත. පරණවිතාන මහතා සඳකඩපහණේ කැටයම් තුළින් වාටියේ ඇති රටාවෙන් සංසාර චක්‍රයේ ගිනිදැල් වළල්ලත්, සත්ත්ව රූපපෙළින් ජාති, ජරා, ව්‍යාධි, මරණ යනාදි සතර විපතත්, ලියවැලෙන් මිනිස් දිවියේ බැඳී පවත්නා තණ්හාවත්, හංස පංතියෙන් භව ගමන මැඩලීමට ආත්ම ශික්ෂණයත්, පද්මයෙන් නිවනත් සංකේතවත් වනබව ප්‍රකාශ කර තිබේ. එය භව චක්‍රය හා නිවන යන භෞතික ප්‍රකාශනය අර්ථ ගන්වන මෙතෙක් පහළ වූ උසස්ම දාර්ශනික මතයයි. නමුත් එය විද්වතුන්ගේ විවේචනයට විචාරයට ලක්විය. මාර්ටින් වික්‍රමසිංහ ප්‍රකාශ කරනුයේ මෙයින් උත්තම බෞද්ධ සංකල්පයක් නිරූපිත නම් එය පයට පෑගෙන ස්ථානයක තැන්පත් කළයුතු අන්දමින් නිර්මාණය කලේ ඇයි ද? යන්න පවසමින් පරණවිතානයන්ගේ මතය විවේචනයට ලක්කර ඇත. නමුත් පාරිශුද්ධිය ගෙන දෙන්නේ පවිත්‍ර නෙළුම් මලෙන් බවත්, සඳකඩපහණේ සිටින කෙනෙකුගේ පාද සංකේතාත්මක වශයෙන් දෝවනය වන්නේත්, විහාරයේ වැඩ සිටින බුදුන්ගේ නෙළුම් ආසනය දෝවනය වන්නේත් නෙළුම් මලෙන් බවත්, නෙළුම් මල දෝවනයේ සංකේතයක් බව තවකෙකුගේ මතයකි. ගුණපාල සේනාධීර අදහස් කරන්නේ ඇතා, අශ්වයා, සිංහයා, ගවයාගෙන් සතර විපත් සංකේතවත් වුවද කවර විපතක් සිදුවේ ද යන්න දක්වා නොතිබෙන බවයි. එහිදී බෞද්ධ කැටයම් කලාවෙහි විවිධ අර්ථ නිරූපණයටත්, මුරගලෙහි සතර දිශා නිරූපණයටත්, අශෝක කුළුණු ශීර්ෂයන්හි ගවයා, සිංහයා උත්තරීතර අරුත් සහිතවත්, බුදුරදුන් ශාක්‍යසිංහ, සෑසි, ගෝතම (ගවයන් බොහෝ ගෝත්‍ර කොට ඇත) නාමයෙන් හඳුන්වා තිබීමත්, අභිනිෂ්ක්‍රමණයේ දී අශ්වයා විශේෂ වීමත්, ඡද්දන්ත, පාරිලෙය්‍ය, නාලාගිරි බුද්ධ චරිත කතාවල ඇතා උසස් වීමත් තුළින් සංසාර විපත් ඔවුන්ගෙන් නිරූපණය නොවන බැව් පසක් වේ. පරණවිතානයන් අනුරාධපුර යුගයේ එක සමාන කැටයම් ලක්ෂණ ඇති සඳකඩපහණ හයක් තෝරාගෙන සිදුකර ඇති මෙම අර්ථකතනය තුළ කැටයම් රහිත මුල්කාලීන සඳකඩපහණ ඔහුගෙන් ගිලිහුනේ ඇයි ද යන්න ගැටළුවකි. පරණවිතානයන්ගේ සංසාරය හා නිර්වාණය නිරූපණය කිරීම සඳහා යොදාගෙන ඇති මෙකී අර්ථකතනය අභියෝගයට ලක්කරන්නට කිසිවෙකුත් මෙතෙක් සමත්ව නැත. එහෙත් එම විචාර මාර්ගයට හානි නොවන පරිදි පසුකාලීන විචාරකයන් විසින් එම අර්ථකතනය වඩාත් සංවර්ධනය කිරීමට උත්සුක වී ඇති බැව් මේ පිළිබඳ අධ්‍යයනයේදී පැහැදිලි වේ.

ප්‍රමුඛ පද : අර්ථකතනය, සඳකඩපහණ, කැටයම්, නෙළුම්

---

[1] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. *shiromisandamali069@gmail.com*